**සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවා ගණයේ වාග් චිකිත්සක තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: අදාළ නොවේ

1.2 අමාත්‍යාංශය: සෞඛ්‍ය අමාත්‍යාංශය
යොමු අංකය: TA/G/PSM/SP/02/2016 දිනය: 2018.11.27

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය: DMS/0054 දිනය: 2013.12.31

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:
යොමු අංකය: EST-2/02/REC/0927 දිනය: 2018.09.26

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය: NSCC/4/13/SR/19 දිනය: 2018.08.02

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:
යොමු අංකය: PSC/EST/06-01-13/01/2019 දිනය: 2020.02.20

02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර:

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාව

3.2. ශ්‍රේණිය: III, II, I සහ අධි ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය:

වෛද්‍ය විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ සම සෞඛ්‍ය විද්‍යා උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව හදාරා වෘත්තිකයෙකු ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා රෝග විනිශ්චය, රෝග නිවාරණය හා රෝග ප්‍රතිකාර සේවා ඉටු කිරීම සඳහා පත්කිරීමේ බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලැබ ඇති කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

කථන හා භාෂා චිකිත්සාව යනු "ළමුන්ගේ සහ වැඩිහිටියන්ගේ කථන හා භාෂා ගැටලු සහ ඒ හා සම්බන්ධ ගිලීමේ ක්‍රියාකාරීත්වය අපහසුතා ඇගයීම, විනිශ්චය කිරීම, අදාළ වාග් චිකිත්සක ක්‍රමවේද තීරණය කිරීම/සකස් කිරීම සහ ඒ සඳහා වාග් චිකිත්සක ප්‍රතිකාර කිරීම සම්බන්ධ විශේෂ වෘත්තීය කුසලතාවයයි"

3.4 කාර්යයන් පැවරීම:

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය: මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

සටහන- විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය: MT-6-2016

5.2 වැටුප් පරිමාණය: රු. 32,080-10x445-11x660-10x730-10x750-58,590

5.3 සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු. 32,80/- |
| II | පියවර 12 | රු. 37,190/- |
| I | පියවර 23 | රු. 44,520/- |
| අධි | පියවර 32 | රු. 51,090/- |

සටහන : වැටුප් ගෙවීම සහ සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1

| අනුමත තනතුරු නාමය | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| වාග් චිකිත්සක | III, II, I,<br>අධි ශ්‍රේණිය | 81 | ළමා රෝග, ස්නායු රෝග, උගුර/කණ/නාසය, වෛද්‍ය, ශල්‍ය, මානසික රෝග, මුඛ/හනුක/දන්ත හා අදාළ වෙනත් කවර හෝ ක්ෂේත්‍රයකින් වාග් චිකිත්සාව සඳහා යොමුවන රෝගීන්ගේ කථන හා භාෂා ආබාධ සහ එයට අදාළ ගිලීමේ ක්‍රියාකාරීත්වමය අපහසුතා ඇගයීම, විනිශ්චය කිරීම, අදාළ වාග් චිකිත්සක ප්‍රතිකාර ක්‍රමවේද තීරණය කිරීම/ සකස් කිරීම සහ ඒ සඳහා වාග් චිකිත්සක ප්‍රතිකාර ලබාදීම සහ තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරී |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: වාග් චිකිත්සක - 81

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II,I හා අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්:

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම්:

| අනු අංකය | තනතුර | අධ්‍යාපන/ වෘත්තිය සුදුසුකම් |
|---|---|---|
| 01 | වාග් චිකිත්සක | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කථන හා භාෂා චිකිත්සාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් එම උපාධිය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කථන හා භාෂා චිකිත්සාව පිළිබඳ උපාධියක් විය යුතුය. |

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : කථන හා භාෂා චිකිත්සක නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් : I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ය චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.

IV. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

7.2.3 වයස:

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18
7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

7.2.4.1.1 පවත්වන බලධාරියා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)
ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා: සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ

**08.** කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩයිමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 3 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම - 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 3 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම - 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම - 04) |

| | ගත වීමට පෙර | |
|---|---|---|

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ? වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද:

1 කාර්යක්ෂමතා කඩඉම - සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

2 කාර්යක්ෂමතා කඩඉම - සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

3 කාර්යක්ෂමතා කඩඉම - සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවා ගැනීමේ පරිපාටිය | නව බඳවා ගැනීමේ පරිපාටිය |
| පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>1.කාර්යාල ක්‍රම<br>2.මුදල් රෙගුලාසි<br>3.දෙපාර්තමේන්තු රෙගුලාසි | පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>1.ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>2.මුදල් රෙගුලාසි |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>විෂයානුබද්ධ කරුණු | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>1.විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>2.ආයතන සංග්‍රහය<br>3.මුදල් රෙගුලාසි |
| තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>කාර්ය විශේෂිත දැනුම | තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>විෂයානුබද්ධ - ව්‍යුහගත රචනා<br>(කාර්ය විශේෂිත දැනුම) |

අ) නව බඳවා ගැනීමේ පරිපාටි අනුමත වූ දින සිට පැරණි බඳවා ගැනීමේ පරිපාටියේ කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි යන විෂයන් දෙක සමත් නිලධාරින් පැරණි බඳවා ගැනීමේ පරිපාටි අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය සමත් වීමෙන් නිදහස් කරනු ලැබේ.

ආ) පැරණි බඳවා ගැනීමේ පරිපාටියේ කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි යන විෂයන් දෙකෙන් එකක් පමණක් සමත් නිලධාරින් නව බඳවා ගැනීමේ පරිපාටියේ කාර්යක්ෂමතා කඩඉම යටතේ අනුමත අනුරූපී විෂය සමත් වීමෙන් පසු පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළා සේ සලකා නිදහස් කරනු ලැබේ.

ඇ)පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂයෙන් සමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි යන ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

ඇ)පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අසමත් නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව ප්‍රශ්න පත්‍ර තුන සඳහාම පෙනී සිටිය යුතුය

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතුය. |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 1/2014 හා ඊට ආනුෂංගික චක්‍ර ලේඛ අනුව නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා තිබිය යුතුයි. |

10. ශ්‍රේණි උසස් කිරීම්:

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (10ක්) උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම

v. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීමේ බලධාරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (10 ක්) උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.3 I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයා ගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීමේ බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය: 1. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

2. උසස් කිරීම්වලදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 සහ ඊට ආනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අදාල වේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාල නොවේ.

13. රජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුලත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය (බඳවා ගැනීමේ පරිපාටිය) ක්‍රියාත්මක වන දිනට සේවයේ නියතුවුවන් සඳහා)

නව බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 අනුව MT – 06 –2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන වාග් චිකිත්සක නිලධාරීන් ප්‍රතිසංවිධිත වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තින්ගේ සේවයට අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 පරිච්ඡේදයේ විධි විධාන වලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදි අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහල වැටුප් පියවරේ තැබීමද නොකල යුතුය.

සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ III වැනි ශ්‍රේණියට

සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ II වැනි ශ්‍රේණියට

සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ I වැනි ශ්‍රේණියට

සේවයේ I ශ්‍රේණියේ වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා I ශ්‍රේණියට නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාලවේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති කරුණක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණයවේ.

17.අන්තර්කාල විධිවිධාන : අදාල නොවේ.

18.ක්‍රියාත්මක වන දිනය : මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන 2016.01.01 දින සිට බලාත්මක වේ.

සකස් කළේ : අත්සන : ..........................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

පරීක්ෂා කළේ : අත්සන : ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම : ..........................
තනතුර : ..........................
දිනය : ..........................

එල්. එස්. මාගම්මුල්ල
අධ්‍යක්ෂ (ආයතන) 02
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නම : ..........................
තනතුර : විසන්ති ගුණසේකර
දිනය : ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

නම : ..........................
තනතුර : ..........................

දිනය : 2021.12.16

නිල මුද්‍රව :

---

යොමු අංකය : MH/TA/15/ST/SOR/01/2021

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හි MT-6 වාග් චිකිත්සක තනතුර සඳහා 2020.02.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන : ..........................

නම : ..........................

ලේකම්

සෞඛ්‍ය ..........................අමාත්‍යාංශය

දිනය: 2021.12.28

නිල මුද්‍රාව :

---

යොමු අංකය : PSC/EST/06-01-13/01/2019

.......................................................................... හි
..........................
සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ MT-6 වාග් චිකිත්සක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2020.02.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..........................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2022.01.27

නිල මුද්‍රාව : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමුණුම 01

අමාත්‍යාංශය: සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

01.විභාගයේ නම : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂයයන් | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | 50 | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | 40 | පැය 01 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
තනතුරු වල පුරප්පාඩු ඇති වීම මත අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 2. සාමාන්‍ය දැනීම | වාග් චිකිත්සක තනතුරට අදාල විෂය දැනුම අදාල කර තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම. |

සකස් කළේ:

අත්සන : ..............................

නම : එල්. බී. මාගම්මුල්ල

තනතුර : අධ්‍යක්ෂ (පාලන) III සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"

දිනය : 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

පරීක්ෂා කළේ :

අත්සන : ..............................

නම : වසන්ති ගුණසේකර

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) I සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"

දිනය : කොළඹ 10.

..............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : වෛද්‍ය අසේල ගුණවර්ධන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"

දිනය : 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

නිල මුද්‍රාව :

## ඇමුණුම 02

අමාත්‍යාංශය: සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

01. විභාගයේ නම : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ වාග් චිකිත්සක තනතුරේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 08කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 08කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br><br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br>IV, XII, XIII, XIV, XIX, XLVII, XLVIII |
| 2. මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි පරිච්ඡේද මත සැකසේ.<br><br>I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම. (මුදල් රෙගුලාසි 1සිට 68 දක්වා)<br><br>III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම.<br>(මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා) |

සකස් කළේ :

අත්සන : ......................................

නම : එල්. එස්. මාගම්මුල්ල

තනතුර : අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : ......................................

පරීක්ෂා කළේ :

අත්සන : ......................................

නම : වසන්ති ගුණසේකර

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", කොළඹ 10.

දිනය : ......................................

.................................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ........ වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය

තනතුර : ........"සුවසිරිපාය"....
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය : ..............................

නිල මුද්‍රව :

ඇමුණුම 03

අමාත්‍යාංශය: සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

01. විභාගයේ නම : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ වාග් චිකිත්සක තනතුරේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

(අ) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වල ස්වභාවය හා ප්‍රශ්න සංඛ්‍යාව | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 07කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 04ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න 07කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 04ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 02 | 100 | 40% |

(ආ) දෙපාර්තමේන්තු පරීක්ෂණය

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ප්‍රමාණය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත | ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 08කින් සමන්විත වන ඉන් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |
| විෂයානුබද්ධ වාචික | විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණුපාන ගැටලු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. | විනාඩි 15 | 100 | 40% |
| විෂයානුබද්ධ ප්‍රායෝගික | විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණය | පරීක්ෂණය අනුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br><br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br>XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII |

| | |
|---|---|
| 2.මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි මත සැකසේ.<br><br>VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම් ( මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා)<br>XIII වන පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා: සැපයීම් / මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම (මුදල් රෙගුලාසි 708 සිට 755 දක්වා). |
| 3. විෂයය බද්ධ කරුණු | වාග් චිකිත්සාව සම්බන්ධව නිලධාරියාගේ රාජකාරී කටයුතු පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. |

සකස් කළේ :

අත්සන : ..........................................

එල්. එස්. මාගම්මුල්ල
අධ්‍යක්ෂ (පාලන) 02
සෞඛ්‍ය අමාත්‍යාංශය

නම : ..........................................

"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

තනතුර : ..........................................

දිනය : ..........................................

පරීක්ෂා කළේ :

අත්සන : ..........................................

වසන්ති ගුණසේකර

නම : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III

සෞඛ්‍ය අමාත්‍යාංශය

තනතුර : .................."සුවසිරිපාය"..................

දිනය : ..................කොළඹ 10...................

..........................................................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

වෛද්‍ය අසේල ගුණවර්ධන

නම : ..........................................සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

සෞඛ්‍ය අමාත්‍යාංශය

තනතුර : .........................................."සුවසිරිපාය"

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

දිනය : ..........................................කොළඹ 10.

නිල මුද්‍රව :

ඇමුණුම 04

අමාත්‍යාංශය: සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය

01. විභාගයේ නම : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ වාග් චිකිත්සක තනතුරේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වල ස්භාවය හා ප්‍රශ්න සංඛ්‍යාව | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ (කාර්ය විශේෂිත දැනුම) | ප්‍රශ්නය 8න් 5කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 03 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්ය විශේෂිත දැනුම | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් හි විෂය නිර්දේශයන්ට ඇතුළත් කරුණු පිළිබඳ නිලධාරියාගේ දැනුම කුසලතාවන්, ඔහුගේ යෝග්‍යතාවයට සරිලන පරිදි වැඩි දියුණු වී තිබේ ද යන්න හා ගත වූ කාලය තුළ එකී ක්ෂේත්‍රයන්හි සිදු වී ඇති නව්‍යකරණයන් පිළිබඳ දැනුවත් වී තිබීම පිළිබඳ මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි. |

සකස් කළේ :

අත්සන :............................................

නම : එල්. එස්. මාගම්මුල්ල අධ්‍යක්ෂ (පාලන) 02

තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"

දිනය : 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

පරීක්ෂා කළේ :

අත්සන :............................................

නම : වසන්ති ගුණසේකර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III

තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"

දිනය : කොළඹ 10.

............................................................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : වෛද්‍ය අසේල ගුණවර්ධන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

දිනය : කොළඹ 10.

නිල මුද්‍රාව :